

# පන්හිඳයි පින්සලයි

සිසිර දිසානායක

“ආයුබෝවන්ඩ කිව්වා...“

“ආයුබෝවන්... ආයුබෝවන්...“

පන්හිඳයි පින්සලයි නුහුරු තැනකදි මුණ ගැහිලා.. කොහෙද මේ..? සන්නසේ දී..

“ආරාධනාව ලැබුණ ද..?“ පන්හිඳ ඇහුවා.

“නැතුව ... නැතුව..“ පින්සල් ඇස් වල සතුට වෑහෙනවා.

මුන්නැහේලා අකුරු කරන කාලෙ ඉඳල ම ගජ මිත්‍රයෝ.. ඒ දවස් වල නම් වැඩි ඉල්ලුමක් තිබුණෙ පින්සලට. අනේ අපරාදෙ කියන්න බැහැ පින්සල ඒ හැම දේකදිම පන්හිඳවත් යා කර ගත්තා. පන්හිඳත් අද වෙනකල් ම ඒ ගුණයට නම් සළකනවා.

“අපේ කට්ටිය මේ යහපත් කටයුත්තකට මුළ පුරන වෙලාවේ පින්සලට ආරාදනා නොකර බැහැ නොවැ..“

“ලබාපු සිංහල අවුරුද්දෙ අලුත් දෙයක් කරන්න ලැබෙන එකත් මොන තරම් වාසනාවක් ද? ලංකාවෙන් ආවට පස්සෙම අවුරුදු කුමාරයෙක් අඳින්න ලැබුණා මයි ඔය.. මගේ කුමාරයා මම එව්වෙ කොහා පිටෙන්...“

“ඇති ඇති ඉතින්... දැන් අපි මොනවද මෙතෙන්ට කරන්නෙ..?“ පන්හිඳ ඇහුවා.

නොදන්න දේවල් කරන්න ගිහින් වරිගෙ නහගන්නවාට වඩා නරකද දන්න දෙයක් ම අලුත් විදියකට කළොත්..? සන්නසේ හේතු පාඨය දැක්කද..? පින්සල කොහොමත් හැම දෙයක් ගැන ම විපරමෙනුයි ඉන්නෙ.. එහෙම නැත්නම් කොහොමද කොස් කොලයකුයි පොල් කොලයකුයි වෙන් කරවලා පොඩි අය ලවා අන්දවන්නෙ..?“

එහෙම ලේසියට සැහැල්ලුවට කිව්වට ලෝමයකුයි කෙස් ගහකුයි අතර තියෙන වෙනස පවා තෝරා බේරාගෙන අඳින්න පුළුවන් සූක්ෂම බවකුයි පින්සලට තියෙන්නෙ. වර්ණ රටා ගැන කියන්න ගියත් ඔය වාගෙම තමයි.

“උරුමය වෙනුවෙන්...“ පන්හිඳේ අලුත් ම කෙටි සටහන් පොතේ ඒ වෙනකොටත් කුරුටු ගෑවිලා. ඒ විතරක් නෙවෙයි.. ඒ වටා රවුමකුත් ඇඳිලා.. මේ පන්හිඳ වැල් වටාරම් ලියනවාට වඩා වචන ටිකක් ගැට ගහලා කවියක් නිසඳැසක් ගී පද රචනාවක් ලියලා පැත්තකට වෙන්න යි කැමැත්ත. ඒක පින්සලටත් පහසුවක් වුණා .. ඒත් ඉතින් රට රටවල ගියාම නොහුරු දේවල් කරන්නත් ආරාධනා ලැබෙනවා නේ. ඩූලා නැති වලට කණයා පණ්ඩිතයා ය කිව්වලුනෙ..

“ඔය ලිව්වාමයි මතක් වුණේ..“ පන්හිඳ ලියමින් හිටපු එක නැවැත්තුවෙ කරන්ට් එක නැතිව ගිය විදුලි දුම්රියක් වගේ. මට මතක් වුණේ අපේ මව්



බසේ ජන වහර...

“මොන තරම් අලංකාර අපූරු භාෂාවක් ද හැබෑට..“ පින්සලත් හුම් මිටි තිව්වා. “.. සිංහල භාෂාව ගැන දන්නා කියන ඇත්තෝ නම් මේ රටෙත් හිඟ නෑ හැබැයි...“

“ඒ වගේම තමයි අපේ ඇත්තන් කතා බහ කරන දේත්.. කලින් ලියපු කියමනත් ඒ වගේනේ.. අපි ඒ ගැන මොනවා හරි කරමුද..?“ පන්හිඳ ඇහුවා..

“පණ්ඩිත කම් කරන්න ගිහින් මාව අමාරුවෙ දමන්න නම් එපා ඔන්න..“ පින්සලට ටිකක් තරහ ගිහින්..

“ඒ වෙලාවට කරන්න තියෙන්නෙ කාටවත් නොතේරෙන බලියක් අඳින එකයි... ඒක ඉබේම සම්භාව්‍ය කෘතියක් වෙයි...“ පන්හිඳ තමන්ගෙ තුඩට නොදැනෙන්න ලියලා දැම්මේ තීන්ත යන්තම් කොලයේ ගෑවෙන නොගෑවෙන විදිහට.. ඒ හදිස්සියක් වුණොත් කුරුටු ගාලා දාන්න හිතාගෙන.. පන්හිඳ කවදත් ලියන්න ඕනෙ දේ ලිව්වා. ඒත් කාගෙවත් හිත රිද්දන්න හිතාගෙන නෙවෙයි. හිත රිදේවි කියලා හිතුණ වෙලාවට ඒ දේවල් කපලා හරින්නටත් ලෝබ වුණේ නැහැ.. යම් කිසි දේකින් කම්පා වුණාම හැඟීම් වලට එකඟව පිටු පිරෙව්වාට දෙවෙනි වතාවෙ කියවනකොට බුද්ධියට එකඟව කුරුටු ගාලා දාන්න තරම් නම්‍යශීලී බවකුත් පන්හිඳ ට තිබුණා.

“බලියක් සම්භාව්‍ය වෙනවා නම් ළමයින් අඳින බලිත් සම්භාව්‍ය වෙන්න එපායැ..“ පින්සල ඔලොක්කුවට වගේ ඇහුවා..

“නිර්මාණයක සම්භාව්‍ය අසම්භාව්‍ය බව තීරණය වෙන්නෙ ඒ නිර්මාණය කළ අය අනුව නෙවෙයි. ඒ නිර්මාණයේ අන්තර්ගතයට. අන්තර්ගතයට අදාල හැඟීම් කැවිලා තියෙනවා නම් ඒක සාර්ථකයි. කුඩා ළමයෙක් අඳින චිත්‍රයක් හරිම නිර්මලයි. ඒ දරුවාගේ ළමා සිතිවිලි නිර්ව්‍යාජව බලියකට වුණත් ගලා යනවා. හැබැයි ඉතින් වැඩිහිටියෙක් ළමා චිත්‍රයක් අඳින්න ගියොත් එතන තියෙන්නෙ හැඟීම් වලින් තොර කෘතිම බලියක් විතරයි.“ පන්හිඳ බහුසුතයෙක් වගේ ලියන්න පටන් ගත්තා.

“ඔව් ඉතින් කවියක ගී පද රචනාවක වුණත් සරු බව රඳා පවතින්නෙ ඒ රචකයා කවියා ප්‍රවීණයෙක්ද ප්‍රතීනයෙක් ද කියන කාරණාව උඩ නෙවෙයි. ඒත් පන් ඇසූ පිරූතැන් ඇති බව සතත අභ්‍යාසය නිසඟ ගුණය නිර්මාණයක යහගුණ මතු කරන්න නොදැනීම හවුල් වෙනවා නේද..?“ අකුරු කරන කාලේ පන්හිඳව පින්සල ඇමතුවේ “පන්“ කියන කෙටි නමින්. ඒ ආදරේට.. ලෙන්ගතු කමට.. ඒ වගේම පන්හිඳ පින්සල ඇමතුවේ “පින්“ කියලා.. ඒත් ආදරේට.. හුරතලේට තමයි..

ඒත් ඉතින් පින්සල නම් කිව්වේ හැමෝටම “අරක කරපන් මේක කරපන්“ කියලා පණ්ඩිත කම් ලියන නිසා පන් කියන විධාන ක්‍රියා රූපය පන්හිඳගේ කෙටි නමට තෝරා ගත්තා ය කියලයි. පන්හිඳත් දෙවෙනි වුනේ නැහැ..

“ඔව් ඉතින් මම පන් කියලා උපදෙස් දීලා ලියන දේට පින්සිද්ධ වෙන්න උඹත් ඉතින් මොන බලියක් හරි අඳින පිනෙක් නිසා පින් කියන නම ගැලපෙනවා අගේට..“

ඒත් ඒ නම් පද බැඳ ගත්තෙ නියම නම් දෙකේ මුල් අකුරු වලින් කියලා දෙන්නට දෙන්නා ම හිත යටින් දන්නවා.

අලුත් අවුරුද්දේ අලුත් තැනක දී මුණ ගැහිලා කැවුම් කොකිස් කෙසෙල් එහෙම සප්පායම් වුණ යාලුවෝ දෙන්නා ඉඟුරු දමපු කහට කෝප්පයක් බිව්වෙ කිතුල් හකුරුත් එක්ක. බුලත් විට සප්පායම් වෙන අතරේ දෙන්නාගේ තකිකාවත වුණේ ඉදිරියට කරන්න යන වැඩ පිළිවෙල ගැන. නොහුරු රටක නොහුරු තැනකදි වුණත් තමන්ගෙ හුරු පුරුදු නම් අත අරින්න ටිකක් අමාරුයි වගේ.

නියම සිංහල බස් වහර ගැන යමක් සිහි එළවාගන්න කිතුලක් තියෙන ඉසව්වක් ගැන ඉව කර කර දෙන්නා එක්ක පාරට බැස්සා. ගජයෝ දෙන්නා ආයෙත් අල්ලා ගන්න මාසයක් යාවි කියලයි හිතෙන්නෙ..

■




ස්වභාවික විපත් අධ්‍යයනය කරන්න මැති ඇමති පිරිසක් රට යති..

**දිවයින පුවතක්**

**සුනාමියට ජයවේවා...**

ඉන්දුනීසියාවේ තෙල් උතුරයි.

**ලක්බිම පුවතක්**

**ලංකාවෙත් උතුරනවා........... අරක්කු...**

ඩෙල්ටා ගුඩ්රම් ගායිකාව ගී තැටි සමාගම් වල ඉල්ලීම අනුව සිය මව කළමනාකාර ධුරයෙන් ඉවත් කරයි

**දි ඔස්ට්‍රේලියන් පුවතක්**

Blood is thicker than water
Money is thicker than blood

සුනාමියේදී කිසිම භේදයකින් තොරව රට ගොඩ නැඟීමට කව්රුත් එකතු වුණා..

**ලක්බිම පුවතක්**

**දැක්කා... දැක්කා... එකමුතු කමේ තරම හොඳටම දැක්කා......**

අතුරුදහන් වූ පොලිස් පරීක්ෂකවරයා පිලිබඳව රතු කුරුසය කොටින්ගෙන් විමසයි..

**දි ලංකා ඇකඩමික් පුවතක්**

**හොරාගෙ අම්මගෙන් පේන අහනවා..**

අපේ රට ගොඩනගන්න දැන්වත් උත්සාහ ගනිමු ..... එස් බී දිසානායක සිරගෙදර සිට ලියයි

**ලක්බිම ඉරිදා සංග්‍රහය**

**වරේවා..... ඔක්කොම දේසපාලකයන් මාරුවෙන් මාරුවට හිර ගෙදර යමු ද?**